# 23 සුභාෂිතය

පුද්ගලයා තුළ සුදන ගුණ වර්ධනය කිරීම පිණිස පැරණි, සාහිත්‍යකරුවන් විශාල මෙහෙයක් කළ බව අපේ ඇතැම් පැරණි පද්‍ය කෘතිවලින් සනාථ වේ. වීදාගම මෛත්‍රේය හිමියන්ගේ ලෝවැඩ සඟරාව, රණස්ගල්ල හිමියන්ගේ ලෝකෝපකාරය, සිල්වා ගුරු මුහන්දිරම්තුමාගේ සිරිත් මල්දම මෙබඳු පද්‍ය නිර්මාණ කෘති කීපයකි. මේවා උපදේශ කාව්‍ය ගණයෙහි ද සැලකේ.

උපදේශ කාව්‍ය අතර සුභාෂිතයට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය වැනි කෘති බුදුදහම පදනම් කර ගෙන ලියැවුණ ද සුභාෂිතය එසේ නො වීම විශේෂත්වයකි. 'සුභාෂිතය' යනු මනා වූ කියුම් යන්න ය. සීතාවක යුගයේ දී අලගියවන්න මුකවෙටිතුමා විසින් මේ කෘතිය රචනා කර ඇත. ඔහු හිස්සැල්ලේ ධර්මද්වජ පඬිතුමාගේ පුත්‍රයා ය. සැවුල් සන්දේශය, කුස ජාතක කාව්‍යය හා දහම් සොඬ දා කව අලගියවන්න කවියාගේ සෙසු කෘති වෙයි. කුස්තන්තීනු හටන හා පරංගි හටන යන කෘති ද ඔහුගේ බවට මතයක් පවතී.

සීතාවක යුගය දේශපාලන මෙන් ම සමාජාර්ථික හා සංස්කෘතික පරිහාණි කාලයක් සේ පිළිගැනේ. එවන් අවධියක සමාජය තුළ සාරධර්ම පිරිහී යාම නිතැතින් ම සිදු වේ. එදා සමාජයේ තිබූ දුර්වලතා හඳුනා ගෙන යම් ප්‍රමාණයකට හෝ යහගුණ වර්ධනය කිරීම පිණිස උපදෙස් දීම අරමුණු කර ගෙන මෙය ලියැවුණු බව පෙනේ. ඉදිරිපත් කරන ජීවන දර්ශනය දෘෂ්ටාන්ත (උපමා ආදිය) මගින් සනාථ කර දැක්වීම ද මෙහි ලක්ෂණයකි. බොහෝ පද්‍යවල පළමු දෙපදයෙන් පැවසෙන කාරණය ඊළඟ පාද දෙකේ දැක්වෙන උපමාවෙන් විස්තර කර ඇත.

පාලි ධම්ම පදය, දෙමළ උපදේශ ග්‍රන්ථ වන තිරුක්කුරළ්, නාලඩියාර් වැනි ග්‍රන්ථ ද සංස්කෘත උපදේශ ග්‍රන්ථ වන පංච තන්ත්‍රය, හිතෝපදේශය ආදිය ද අලගියවන්න සුභාෂිතය රචනයේ දී මූලාශ්‍රය කර ගත් බව දැක ගත හැකි ය.

එමෙන් ම රසිකයාට බෙහෙවින් සමීප විරිතක් වූ සමුද්‍රඝෝෂ විරිත යොදා ගෙන ඇති සුභාෂිතයෙහි අනුප්‍රාසය, එළිසමය වැනි කාව්‍ය උපක්‍රම සාර්ථකව භාවිත කර ඇත. මේ පාඩමට ඇතුළත් වන්නේ සුභාෂිතයෙන් උපුටා ගත් කවි කිහිපයකි.

| | |
|---|---|
| නො වි ත ර තෙද බලැති මහතුන් හට | පවර |
| වැ ර සැ ර නො වන නුනුවණ දන බඳිනු | වෙර |
| තු ගු ත ර ගිරි පළන දළ දළගින් | පැහැර |
| ම ත ව ර ණිඳුට පෙදෙනැන වෙහෙසෙන | අයුර |

**අදහස :**
අප්‍රමාණ තේජස් ද බලය ද ඇත්තා වූ උතුම් මහාත්මයන් හට වීරසාර ගතියෙන් හා නුවණින්
අඩු මිනිසුන් වෛර බැඳීම විශාල පර්වත දැඩි දළ අගින් පහර දී පළා දමන මත් ඇත් රජකුට පයින් ඇන වෙහෙස ගන්නාක් වැන්න.

| | |
|---|---|
| අ ම ර ස වන් අඹ රස බුදිමින් | සිනිඳු |
| නිති ගෙ උයන් පෙදෙසෙහි සරමින් | පසිඳු |
| එක පැහැයෙන් ඉඳිතත් කොවුලනට | බඳු |
| නද පමණින් දැන ගත හැකි රිවුන් | ඉඳු |

**අදහස :**
අමා රසය බඳු මිහිරි අඹ රසය අනුභව කරමින්, ප්‍රසිද්ධ ගෙවතු ප්‍රදේශයන්හි නිතර සැරි සරමින් කෝකිලයන් හට පැහැයෙන් සමානව සිටියත්, නාදය පමණකින් කපුටන් ඒකාන්තයෙන් දැන ගත හැකි ය.

| | |
|---|---|
| ස පෙ ක් එකකු කැව නසිනේ ඔහු ම | වද |
| අ නෙ ක් ලොවින් නො නැසෙයි සතෙකුත් | එක ද |
| ප ස ක් දුදන පබු කන මුව ළං කළ | ද |
| ව ග ක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු | ද |

**අදහස :**
සර්පයෙක් එක් තැනැත්තකු දෂ්ට කෙළේ නම් එයින් මිය යන්නේ ඒ තැනැත්තා ම නො වේ ද? ලෝකයේ අනෙක් කිසි සතෙක් (ඒ නිසා) නො මැරෙයි. දුදනකු (කේලාම් කීම පිණිස) අධිපතියාගේ කනට මුව ළං කළොත් ඒ නිසා මුළු ජාතියක් ම නසී. එපමණක් නො වෙයි. ඒ අසත්පුරුෂයා ද එයින් විනාශයට පත් වෙයි.

වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු පැන
මහත් ගැඹුරු සිඳු නො යනෙ’වි වෙරළ පැන
ලදත් මෙමුළු දඹදිව රජ සිරි සුදන
සිරිත් ලෙසට පවතී උඩඟු නොවමින

**අදහස :**

නොයෙකුත් ගං, ඔය, ඇළ, දොළවල ජලය ගලා ආවත් මහත් ගැඹුරු සයුර වෙරළ ඉක්මවා නො යන්නාක් මෙන්, සත්පුරුෂයා මේ මුළු ජම්බුද්වීපයෙහි රාජ්‍ය ශ්‍රීය ලැබුණත් අහංකාර නො වී සිරිත් පරිදි ජීවත් වෙයි.

තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වර සුර පුරෙහි වත් නො වසති නිරය ලෙද
ඝොර තර නිරෙහි වත් පරනට වැඩ ඇති ද
සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ

**අදහස :**

බෙහෙවින් තහවුරු ගුණ ඇති සත් පුරුෂයෝ අනුන් හට යහපතක් නො වේ නම් උතුම් දෙව් ලොව වුවත් නිරය මෙන් සලකා එහි වාසය නො කරති. අනුන් හට වැඩක් සැලැසේ නම් අතිශය ඝෝර වූ නරකාදියෙහි වුවත් දෙව් ලොව සේ නිතර කල් ගෙවති.

බ ල යු ත් තුමුල මත වරණිඳු මෙදෙනැ’විස
දි වෙ ත ත් සෙද තමන් සොඬ නො මඬින විලස
ල දු ව ත් නැණැති දන මුළු ලොව ඉසුරු රුස
නො පනත් දෙයක් නො කෙරෙති නිසි දේ ම මිස

**අදහස :**

මහත් බලවත් මත් හස්ති රාජයා මදයෙන් කලබලයට පත්ව ඉක්මන් කොට දිවුව ද තම හොඬවැල නො පාගන්නාක් මෙන් නුවණැත්තෝ මුළු ලෝකයෙහි සම්පත් සියල්ල ලැබුණත් තමන් හට තරම් වන දේ මිස නො ගැළපෙන දෙයක් නො කරති.

## අවබෝධය

1. **අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර, දී ඇති වරණ අතුරින් තෝරා ලියන්න.**

i. සුභාෂිතය අයත් වන්නේ කුමන කාව්‍ය ගණයට ද?

| | | | |
|---|---|---|---|
| (අ) | ඛණ්ඩ කාව්‍ය | (ඇ) | ජන කාව්‍ය |
| (ආ) | උපදේශ කාව්‍ය | (ඉ) | ප්‍රශස්ති කාව්‍ය |

ii. උපදේශ කාව්‍ය ගණයට අයත් නො වන කෘතිය වන්නේ

| | | | |
|---|---|---|---|
| (අ) | සිරිත් මල්දම | (ඇ) | ගුත්තිල කාව්‍යය |
| (ආ) | ලෝවැඩ සඟරාව | (ඉ) | ලෝකෝපකාරය |

iii. **නො ගැළපෙන කියමන තෝරන්න.**

(අ) සුභාෂිතය කියවීමෙන් ජීවන අත්දැකීම් ලබා ගත හැකි ය.

(ආ) පවසන කරුණ දෘෂ්ටාන්තයකින් තහවුරු කිරීමට සුභාෂිත කතුවරයා මැළිකමක් දක්වා ඇත.

(ඇ) උපදේශ කෘති නොමැති යුගවල සාරධර්ම පිරිහී ඇත.

(ඉ) සුභාෂිතය රචනයේ දී පාලි, සංස්කෘත, ද්‍රවිඩ කෘතිවල ආභාසය ලබා ගෙන ඇත.

iv. **තේජස් සහිත උත්තමයාට වෛර කිරීම කවියා දක්වන්නේ**

(අ) පර්වතයකට දළින් පහර දීමක්

(ආ) පර්වතයක් පළා දැමීමක්

(ඇ) මත් වූ ඇත් රජෙකුට පයින් පහරදීමක්

(ඉ) වීර්යය හා නුවණ අඩු වීමක්, ලෙස ය

v. **හයවන කවියෙන් කතුවරයා ඉස්මතු කරන අදහස වන්නේ**

(අ) මත් වූ හස්ති රාජයා තම හොඬය නො පාගයි,

(ආ) මදයෙන් මත් වූ විට ඇතාට මහත් ඵලයක් ලැබේ,

(ඇ) කොතෙක් ඉසුරු ලැබුණත් නැණවතා අයෝග්‍ය දේ නො කරයි,

(ඉ) කෝප වූ විට හස්ති රාජයා වහා දුවන්නට ගනී **යන්න යි.**

2. **පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. මේ පද්‍ය පන්තියේ එක් එක් පද්‍යයෙන් ඉස්මතු කෙරෙන සුදන ගුණ ලියා දක්වන්න.

ii. සුභාෂිතය හා ලෝවැඩ සඟරාව අතර විශේෂ වෙනස්කම කුමක් ද?

iii. 'සමුද්‍රය වෙරළ ඉක්මවා නො යන්නාක් මෙන්' යන්නෙන් තහවුරු කරන්නේ කුමක් ද?

iv. කවියා යොදා ගෙන ඇති උපමා තුනක් සරල බසින් ලියන්න.

v. සුභාෂිත කතුවරයා යොදා ගත් භාෂා ලක්ෂණ තුනක් ලියන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් යෙදුම්වල අර්ථ පැහැදිලි කරන්න.
   i. වැරසැර නො වන නුනුවණ දන බඳිනු වෙර
   ii. නද පමණින් දැන ගත හැකි රිටුන් ඉඳු
   iii. සපෙක් එකකු කැව නසිනේ ඔහු ම වද?
   iv. සිරිත් ලෙසට පවතී උඩගු නො වමින
   v. සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ

2. පහත යෙදුම්වල අරුත් පැහැදිලි කරන්න.
   i. මත වරණිඳු -
   ii. රිටුන් -
   iii. පබු කන -
   iv. ගොරතර නිරෙහි -
   v. මෙදෙනැවිස -

3. පහත දී ඇති පදවල අර්ථ පැහැදිලි වන ලෙස වාක්‍ය තනන්න.
   i. පවර -
   ii. දුදන -
   iii. සිඳු -
   iv. තිරසර -
   v. නැණැති -

4. පහත දී ඇති පද කුමන වියරණ ගණයට අයත් දැයි දක්වන්න.
   i. බලැති -
   ii. පවර -
   iii. දළගින් -
   iv. බුදිමින් -
   v. දුදන -
   vi. ගුණැති -
   vii. සුරපුරෙහි -
   viii. වරණිඳු -
   ix. නො කෙරෙති -
   x. මිස -

5. පාඩමේ ඇතුළත් පද්‍ය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පද්‍යය | උපදේශය | දෘෂ්ටාන්තය/උපමාව |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |

## ප්‍රායෝගික අභ්‍යාස

1. වෙනත් උපදේශ ග්‍රන්ථ තුනකින් පද්‍ය පහ බැගින් ලියන්න.
2. 'තිරසර ගුණැති උතුමෝ පර වැඩෙහි ම යෙදෙති' යන මාතෘකාව යටතේ වාක්‍ය රචනයක් ලියන්න.
3. උපදේශාත්මක අගයකින් යුත් පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.